# ලංසු සඳහා ආරාධනයයි

## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

# 2026 වර්ෂය සඳහා SARP ව්‍යාපෘතිය සඳහා වාහන කුලියට ගැනීම

### ලංසු යොමුව: SARP/G/NCB/Veh/2025/713

1. ශ්‍රී ලංකාව වෙත ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අරමුදලෙන් (IFAD) ණය මුදලක් ලබාගෙන ඇති අතර, එම ණය ලැබීම්වලින් කොටසක් SARP ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යාලය සහ උප කාර්යාල සඳහා අවශ්‍ය වාහන කුලියට ගැනීම සඳහා යෙදවීමට අදහස් කරයි.

2. SARP ව්‍යාපෘතිය, ක්ෂේත්‍ර චාරිකා, (field visits) හා වැව් පුනරුත්ථාපන අධීක්ෂණ කටයුතු සඳහා වසරක (01) කොන්ත්‍රාත් කාලයක් සඳහා වාහන කුලියට සැපයීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලබන අතර වාහන වර්ගය, ලංසු සුරක්ෂණ විස්තර සහ කාණ්ඩ විස්තර (Lot description) පහත වගුවේ දක්වා ඇත. තවද ලංසුව පිළිබඳ වැඩි විස්තර ලංසු ලේඛනයේ දැකිය හැකිය.

| කාණ්ඩ අංකය. | ස්ථානය | වාහන වර්ගය | අවශ්‍ය වාහන ප්‍රමාණය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| කාණ්ඩ ඒ | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය/අංශය, කොළඹ | ද්විත්ව (ඩබල්) කැබ් රථය (4WD සහ වායු සමීකරණය සහිත | 02 | 290,000.00 |
| | | පැසෙන්ජර් වෑන් රථය ද්විත්ව වායු සමීකරණය සහිත (ආසන ධාරිතාවය 08 ට වැඩි) | 01 | |
| කාණ්ඩ බී | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය/අංශය, කොළඹ | මෝටර් රථය (කාර්)(650 cc ට වැඩි සහ වායු සමීකරණය සහිත) | 01 | 50,000.00 |
| කාණ්ඩ සී | ව්‍යාපෘති උප කාර්යාලය - 1 (ප්‍රධාන වශයෙන් කුරුණෑගල, පුත්තලම හා මාතලේ යන දිස්ත්‍රික්ක ආවරණය කරයි) | ද්විත්ව (ඩබල්) කැබ් රථය (4WD සහ වායු සමීකරණය සහිත) | 02 | 150,000.00 |
| කාණ්ඩ ඩී | ව්‍යාපෘති උප කාර්යාලය - 2 (ප්‍රධාන වශයෙන් අනුරාධපුරය, වව්නියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්ක ආවරණය කරයි) | ද්විත්ව (ඩබල්) කැබ් රථය (4WD සහ වායු සමීකරණය සහිත) | 02 | 150,000.00 |

3. ප්‍රතිචාර දැක්වීමට සහ ලංසු ලේඛනයේ දක්වා ඇති සීමාවන්ට අනුගතවීමට කැමති සියළුම යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් සඳහා මෙම ලංසු ආරාධනාව විවෘත වේ. තවද මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු SARP ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන අංශයෙන් ලබා ගත හැක. කාර්යාල වේලාව තුළදී, පහත දැක්වෙන ලිපිනයැති ස්ථානයේදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී ගාස්තු ගෙවීමකින්තොරව ලංසු ලිපි ලේඛන පරික්ෂා කොට බැලිය හැක.

4. ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය (NCB) යටතේ **ලංසු** මෙහෙයවන/කැඳවන අතර www.ifad.org/project-procurement වෙබ් අඩවියෙහි ලබා දී ඇති IFAD ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව මෙම ලංසු ලිපිලේඛනයන්හි ඇගයීමේ පටිපාටිය විස්තරකොට ඇත. NCB ක්‍රියාවලියෙහි විස්තර කොට ඇති පරිදි කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර සුදුසුකම් හා පෙර කාර්යසාධන සමාලෝචනය සහ සත්‍යාපනය කිරීම ඇතුළත් වේ.

**5.** ලංසුවක් ඉදිරිපත් කිරීමට කැමති ලංසුකරුවන් රු. 6,000.00 ක ආපසු ගෙවිය නොහැකි ගාස්තුවක් ගෙවීමෙන් ලංසු ලේඛනය මිලදී ගත යුතුය. එහිදී පහත දැක්වෙන ලිපිනයට, ලංසුකරුගේ සම්පූරණ තොරතුරු සහිතව විද්‍යුත් ලිපියක් හෝ ලිපියක් එවිය යුතුය. ලංසු ලේඛන ලබා ගැනීම සඳහා මුදල්ගෙවීම, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP) අයත්වන **කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7040662, වෙත කෙරෙන බැංකු ගණුදෙනුවක් මගින් සිදු කළ හැකි අතර SARP ව්‍යාපෘතිය වෙත පැමිණීමෙන්ද එහි ගණකාධිකාරී අංශය වෙත මුදල් ගෙවිය හැකියාව ඇත.**

6. ලංසු දත්ත පත්‍රිකාවෙහි , ලංසුකරුවන්ට උපදෙස් 23.1 හි නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ එහි සඳහන් කර ඇති ලිපිනයට 2026 ජනවාරි මස 29 දින පෙ.ව. 11.00 ට පෙර ලංසු ගෙනවිත් භාරදිය යුතු අතර එදින පෙ.ව.11.00 ට ලංසු විවෘත කරනු ලැබේ. ඉලෙක්ට්‍රෝනික් ලංසු පිළිනොගන්නා බව කාරුණාවෙන් සැළකිය යුතුය.

7. කිසිඳු තත්වයක් යටතේ ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා බවත්, එවැනි ප්‍රමාද වී ලැබෙන ලංසු විවෘත නොකරම ආපසු හරවා එවන බවත්, ඒවායෙහි පිරිවැය ලංසුකරු විසින්ම දැරිය යුතු බවත් සියළුම ලංසුකරුවන් දැනගත යුතුය. තවද සියළුම ලංසු සමග ඉහත වගුවේ දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

8. ලිපිනය


**ව්‍යාපෘති අධ්‍යක්ෂ**

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP)

**නොම්මර 2/2/1**, **කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.**

**දුරකථන: 011 2770998 විද්‍යුත් තැපැල: Procurementsarp@gmail.com**